# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

නො. 8,474—1939ක්වූ අගෝස්තු මස 18 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

**වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයි.**

**මුන්නේස්සරම් උත්සවය සම්බන්ධ නියෝග.**

"වන්දනා ගමන් පිළිබඳ ආඥාපණත" යයි නම්කරනලද ආඥාපනතේ (133 වන පරිච්ඡේදය) 2 වන වගන්තියෙන් බලයලත් ප්‍රකාර 1939යේ අගෝස්තු මස පවත්වනුලබන උත්සවය සම්බන්ධ සිරිත්පරිදි මුන්නේස්සරමට යෙදෙන වන්දනා ගමන් අරමුණුකොට මෙහි පහත දැක්වෙන නියෝග මෙම දුන්විමේ මගින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේවන ඇන්ඩෲ කොල්ඩිකට් නමැති මවිසින් පනවනලදී.

ඇන්ඩෲ කොල්ඩිකට්,
ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ.

1939යේ අගෝස්තු මස 12වෙනි දින.

**නියෝග.**

1. මෙම ව්‍යවස්ථාවල "ලැගුම්භූමිය" යන්නෙන් හඟවන්නේ මීට යාකර තිබෙන උප ලේඛනයෙහි සඳහන්වන සීමා තුළ පිහිටි භූමිභාගයයි. "උප දිසාපතිතුමා" යන්නෙන් හඟවන්නේ පුත්තලම හලාවත දෙපළාතේ උප දිසාපතිතුමායි.

2. උප දිසාපතිතුමාගේ විශේෂ හෝ සාමාන්‍ය ආඥාවකින් ලැගුම්භූමියතුළ ලැගුම්ගැනීම තහනම්කරනලද කිසිම ස්ථානයක කිසිවකු විසින් ලැගුම්ගත යුතුනොවේ.

3. ශරීර කෘත්‍ය සඳහා උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව වෙන්කර තිබෙන ස්ථානවල හැර ලැගුම්භූමිය තුළ අන් කිසිතැනක කිසිවකු විසින් මලමූත්‍ර නොකළ යුතුයි.

4. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා වෙන්කර තිබෙන ස්ථානවල හෝ භාජනවල මිස ලැගුම්භූමියේ වෙනතැනක කිසිවකු විසින් කුණුකසල රොඩු ආදිය හෝ කුණුවතුර නොදැමිය යුතුයි.

5. (*a*) ලැගුම්භූමිය තුළවත්තරක් ගාලක්වශයෙන් විශේෂයෙන් නියමකර තිබෙන තැනක හෝ ඒ සඳහා උප දිසාපතිතුමා විසින් මැනවැයි අනුමතකරනලද තැනක හෝ මිස ලැගුම්භූමිය අසල වෙන තැනකවත් ගවයින් තබාගත යුතු නොවේ.

(*b*) ගවයින් භාරව සිටින අය විසින් ලැගුම්භූමිය ඇතුළත පහරන සතුන්ගේ ගොම ඇද ඒව නියමකර තිබෙන ස්ථානයකට ගෙනයන්ට සැලැස්වීමද ගවයින් ලැග්ගන්නා නිතරම පවිත්‍රව තබාගැනීමද යුතුවේ.

6. ආහාර පිණිස සාදා ලැගුම්භූමිය තුළ විකුණනුලබන සියලුම කෑම ජාති (*a*) පිරිසිදු කඩදාසිවල නොහොත් රෙදිවල දවටා හෝ ඉන් වසා හෝ, (*b*) වසනලද වීදුරු පෙට්ටිවල දමා හෝ, (*c*) ලැගුම්භූමිය බාර සනීපාරක්ෂක නිලධාරිතැන විසින් හෝ වෛද්‍ය නිලධාරිතැන විසින් මැනවැයි පිළිගන්නාලද වෙනත් පියන් සහිත භාජනවල දමා හෝ මැස්සන්ගෙන් හා දූවිල්ලෙන් ආරක්ෂාකළ යුතුයි.

7. බෝවෙන රෝගයකින් පෙළෙන කෙනකුට හෝ ලැගුම්භූමියේ පවිත්‍රකමට බාධාවක්ව සිටියහැකි කෙනකුට ලැගුම්භූමියට ඇතුල්වන්නට ඉඩනොදිය යුතුයි.

8. උත්සවය කාලයතුළදී ලැගුම්භූමියෙහි යම් වසංගත රෝගයක් හටගැනුණොත් වන්දනාකාරයින්ට වන්දනාභූමියෙන් පිටවියන්නවද, පිටවී යන මාර්ගය සහ ඔවුන් ගෙනයන ක්‍රම නියමකරන්නටද උප දිසාපතිතුමාට පුළුවන.

9. (*a*) ලැගුම්භූමිය තුළ බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන සෑම අයද, (*b*) ඔහු එසේ පෙළෙන බව දැන දැනම ඔහු සමග වාසයකරන සෑම අයද ඒ රෝගියා ගැන ලැගුම්භූමිය බාරව සිටින සනීපාරක්ෂක නිලධාරිතැනට හෝ වෛද්‍ය නිලධාරිතැනට දැනුම්දෙන්නට ඕනෑය.

10. ලැගුම්භූමියතුළ යම් වැවක් හෝ ළිඳක් යම් නියම කටයුත්තක් සඳහා වෙන්කොට ඒ බවට ඒ ස්ථානයෙහි දැන්වීමක් ගසා තිබෙනවිට එම වැව හෝ ළිඳ එය වෙන්කොට තබා තිබෙන කටයුත්ත සඳහා හැර අන්කිසි දෙයකට කිසිවකු විසින් නොයෙදිය යුතුයි.

11. පාන්ගෙයක් සිසිල්බීම සාදන ස්ථානයක් හෝ ගාලක් තැබීම පිණිස උප දිසාපතිතුමාගෙන් කලින් බලපත්‍රයක් ලබා නොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියතුළ එබඳු ස්ථානයක් තබාගත යුතුනොවේ. බලපත්‍රය නොමිලයේ දෙනු ලැබේ.

12. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබානොගෙන කිසිවකු විසින් ලැගුම්භූමියේ මහ වීදියෙන් හෝ වෙනයම් වීදියකින් අනුමනයේ යම් කඩයක් තැනීම හෝ වෙනයම් ගොඩනැගිල්ලක් දික්කිරීම යුතුනොවේ.

13. උප දිසාපතිතුමාගෙන් කලින් අවසර ලබාගෙනාගෙන කිසිවකු විසින් ලැගුම්භූමිය තුළ හෝ එහි මායිම්වල සිට හැනැප්මක් ඇතුළත හෝ ගිනිකෙළි හෝ තුවක්කු පත්තු නොකළ යුතුයි.

14. උප දිසාපතිතුමා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතුව ඒ සඳහා නියමකර තිබෙන ස්ථානයක හැර ලැගුම් භූමිය තුළ කිසිවකු විසින් සතුන් නොමැරිය යුතුයි. තවද එබඳු ස්ථානයෙහි සතුන් මරන සෑම අයම එය පවිත්‍රව තබා ගැනීම ගැන වගකිය යුතුවේ.

උප ලේඛනය.

මුන්නේශ්වරම් දේවාලයේ ලැගුම්භූමියේ සීමා.

උතුරට පාලකුලම, කොහොඹගස්පිටිය, මුත්තරංදම්ව සහ මුන්නේශ්වරම්කුලම ; දකුණට මුන්නේශ්වරම්වෙල සහ නල්ලනායාගම්කුලම ; නැගෙනහිරට මුන්නේශ්වරම්කුලම, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ නල්ලනායාගම කුලම ; බස්නාහිරට මුන්නේශ්වරම්වෙල, හලාවත සිට කුරුණෑගලට යන මහපාර සහ පාලකුලම.

---

බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳ ආඥාපනත.

කෝට්ටේ පළාත් ආණ්ඩු සභාවේ පාලනය යටතේ පවත්න සීමාවක්තුල බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ 334වෙනි පරිච්ඡේදයේ 4වෙනි වගන්තිය අනුව සුදුසු බලකාරයා වන,

ඩොනල්ඩ් උබයසේකර,
සභාපති.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
කෝට්ටෙ. 10. 8. 1939.

උප ආඥාපනත්.

1. මේ උප ආඥාපනත්හි "සභාපති" යනු කෝට්ටේ පළාත් ආණ්ඩු සභාවේ සභාපතිය.

"සභාව" යනු කෝට්ටේ පළාත් ආණ්ඩු සභාවයි.

"ලියාපදිංචිකිරීමේ වාර්ෂික ගාස්තුව" යනු ආඥාපනතේ 4වෙනි වගන්තිය යටතේ අයකළයුතු ගාස්තුවයි.

"බල්ලෙක් සම්බන්ධ අයිතිකාරයා" යනු බල්ලා භාරව හෝ අයිතිව සිටින තැනැත්තායි.

2. ලියාපදිංචිකිරීමේ වාර්ෂික ගාස්තුව බල්ලා අයිති කාරයා විසින් මේ සභා කාර්‍යාලයේදී ගෙවිය යුතුයි.

(a) සියලුම අවුරුදුවල මාර්තු 31වෙනිදසින් පෙර බල්ලන් හිමිව සිටින සියලුදෙනා විසින්ම එම අවුරුද්දේ මාර්තු මස 31වෙනිදට හෝ ඊට පෙර මෙම ගාස්තුව ගෙවිය යුතුයි.

(b) කිසියම් අවුරුද්දක මාර්තු 31වෙනිදසින් පසු කිසිවකුට බල්ලකු හිමිවීනම් එදින පටන් දින 15ක් ඇතුළත මේ ගාස්තුව කාර්‍යාලයට ගෙවිය යුතුයි.

3. බල්ලන් ලියාපදිංචිකිරීමේ වාර්ෂික ගාස්තුව ගෙවූකල සභාපතිතුමා විසින් බල්ලාගේ හිමියාට පහත සඳහන් දේ දෙනවා ඇත :—

(1) ලියාපදිංචිය පිළිබඳ සහතිකපත්‍රයක්,

(2) සහතිකපත්‍රයේ අංකය මුද්‍රිත ලෝහ තහඩුවක්.

ලියාපදිංචිකිරීමට ඉල්ලූකල මෙහි පහත සඳහන් කරුණු වලට එකඟනොවේනම් එබඳු සහතිකයක්, ලෝහ තහඩුවක් හෝ පටියක් නොදෙනවා ඇත. එසේවුවත් ලියාපදිංචි කිරීමට ඉල්ලුම්පත්‍ර යැවූයිට සභාපතිතුමා මොනයම් බල්ලකු වුවත් තමා ඉදිරියට කැඳවීමට බලය තබාගන්නවා ඇත. තවද—

(a) බල්ලා ඉදිරිපත්නොකලේනම්, හෝ

(b) ඒ බල්ලා ජීවත්වීමට තරම් නොසුදුසු ලෙස රෝගී හෝ අඩය විකල තත්වයක සිටින්නේ නම්, හෝ

(c) ඒ බල්ලාට ස්වාමියාගෙන් හිංසා පීඩා විඳිනු ලබන්නේනම් හෝ නොසලකාහැර තිබේනම් මෙකී ලියාපදිංචිකිරීමේ සහතිකයක්, ලෝහ තහඩුවක් හෝ කරපටියක් නොදෙනවා ඇත.

4. මෙහි පහත සඳහන් කරුණු යටතේ මොනයම් බල්ලකුගේ පෙර සභාපතිතුමා නිකුත්කරදු සහතිකපත්‍රය බල්ලාගේ ස්වාමියාට නිකුත්කරනලද නිවේදනයකින් පසු අවලංගුකරණු ලැබේ :—

(a) යම් බල්ලකු රෝගීව හෝ අඩය විකලව හෝ ජීවත්වීමට තරම් නුසුදුසුයයි සභාපතිතුමාට අදහස්වීනම්,

(b) එම බල්ලා හිංසා පීඩාවිඳිනුලබන්නේනම්, හෝ ස්වාමියා විසින් නොසලකාහැර තිබේනම්, හෝ

(c) මේ බල්ලා වසංගත රෝගයකින් පෙලෙනකල උගේ ස්වාමියා උගට වෙන බල්ලන් සමග හැසිරීමට ඉඩහරින්නේනම්.

5. තුන්වෙනි උප ආඥාපනතේ ප්‍රකාර හෝ හතරවෙනි උප ආඥාපනතේ ප්‍රකාර අවලංගුකරණලද මොනයම් බල්ලකුගේ ස්වාමියෙකුට සභාපතිතුමන් විසින් යවනලද නිවේදනයට අනුව ලියාපදිංචිකිරීම් ප්‍රතික්ෂෙපකල බල්ලන් නියමිත වේලාවට නියමිත ස්ථානයේදී ඉදිරිපත්කළ යුතුයි.

6. ලෝහ තහඩුවක් හෝ කරපටියක් ලබනලද බල්ලෙකුගේ ස්වාමියා විසින් මේ සහතිකපත්‍රය බල පවතින කාලය තුල මේ ලෝහ තහඩුව හෝ කරපටිය බල්ලාගේ බෙල්ලෙහි ශක්තිමත් ලෙස බැඳ තැබීමට අවශ්‍ය සියල්ල කටයුතුයි.

7. මේ උප ආඥාපනත් අනුව සභාපතිතුමන් කෙරෙහි පැවරී තිබෙන බලය සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ක්‍රියාවේ යෙදවීමට සභාපතිතුමාට කැමති කෙනෙකුට ලිය විල්ලකින් පැවරීමට හැකිවේ.

8. මේ සභාව විසින් මීට පෙර සකස්කර නො. 7,989 දරණ 1933 ජූනි මස 23වෙනි දින සහ නො. 8,259යේ දෙසැම්බර් මස 4වෙනි දින ගැසට් පත්‍රවල ප්‍රසිධකරණලද මේ පිළිබඳ නීති මෙයින් අවලංගුවනවා ඇත.

---

ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර් 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ යටයුත්තකට, ඒනම් :—ඇලහැර මින්නේරිය යෝධ ඇල ප්‍රකෘතිමත්කිරීමට සහ කැඩුම්බිඳුම් නැවත සෑදීමත් පිණිස මෙහි පහත සඳහන් වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පළාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. P. P. A 575. ගම—ඇලහැර.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | | අයිතිකම්කියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කිරිමැටියාගේවත්ත | .. | ඉඩම | .. | (1) කිරිමැටියාගේගෙදර හිංඟිරිබන්ඩා, ඇලහැර, (2) කොස්ගහවෙල උක්කුබන්ඩා, හිටපු කෝරාල, (3) එච්. ඇම්. බී. ඔපල්ගල, අම්බන ගම්ආරච්චි, (4) ඔපල්ගල එච්. ඇම්. පුංචිබන්ඩා | 0 0 13·2 |
| 2 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 3·1 |
| 3 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 10 |
| 4 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 14·7 |
| 5 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 9·1 |
| 6 | මොරගොල්ලේවත්ත | .. | එම | .. | ඇලහැර, මොරගොල්ලේගෙදර හිංඟිරිබන්ඩා .. | 0 0 6·2 |
| 7 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 25 |
| 8 | ඉඩන්ගෙදරවත්ත | .. | එම | .. | (1) ඉඩන්ගෙදර කම්රාල, (2) එම මුදියන්සෙ; (3) එම හීන්බංඩා, ඇලහැර පදිංචි | 0 0 10·2 |
| 9 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 2 |
| 10 | අළුත්ගෙදරවත්ත | .. | එම | .. | ඇලහැර පදිංචි (1) අළුත්ගෙදර පුංචිබන්ඩා, (2) එම අප්පුහාමි | 0 0 6·1 |
| 11 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 13·1 |
| 12 | වියන්නවත්ත | .. | එම | .. | ඇලහැර, මොරගොල්ලේගෙදර හිංඟිරිබන්ඩා .. | 0 0 13 |
| 13 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 7·7 |
| 14 | වෙන්දේසිගෙදරවත්ත. | | එම | .. | ඇලහැර පදිංචි (1) වෙන්දේසිගෙදර කිරාල, (2) එම කිරිමැතිකා | 0 0 27·2 |
| 15 | එම | .. | එම | .. | එම .. .. .. | 0 0 12·1 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 16 | ලූලාවත්ත | ඉඩම | ඇලහැර පදිංචි (1) පහලගෙදර පුංචිබන්ඩා, (2) එම කිරල, පුවක්පිටියේ පදිංචි | 0 | 0 | 5·1 |
| 17 | ලූලාවත්ත සහ වීරගහ මුලවත්ත | එම | (1) ජී. ඇම්. පුංචිබන්ඩා, ඇලහැර ගම්ආරච්චි, (2) ඇම්. ඩබ්ලිව්. ආර්. බන්ඩා, කබර කෝරල, (3) හෙලඹගහවත්තේ කළුබන්ඩා, (4) ඩබ්ලිව්. උක්කුබන්ඩා, හෙලඹගහවත්තේ ගම්ආරච්චි | 0 | 0 | 18·1 |
| 18 | පහලගෙදරවත්ත | එම | ඇලහැර පදිංචි (1) පහලගෙදර පුංචිබන්ඩා, (2) පුවක්පිටියේ පදිංචි එම කිරල | 0 | 0 | 11·1 |
| 19 | එම | එම | ඇලහැර පදිංචි පහලගෙදර පුංචිබන්ඩා | 0 | 0 | 3·9 |
| 20 | එම | එම | එම | 0 | 0 | 0·6 |
| 21 | එම | එම | එම | 0 | 2 | 7·1 |
| 22 | මහනලේවත්ත | එම | ඇලහැර පදිංචි (1) මහන්නලාගෙදර හොරතලා, (2) එම කිරා, (3) එම කන්දේවත්තේ පදිංචි සොබනී, (4) ඇලහැර පදිංචි එම කළු | 0 | 0 | 9·7 |
| 23 | අඹගහගෙදරවත්ත | එම | හෙලඹගහවත්තේ පදිංචි (1) ඉහලගෙදර පිංචිඅම්මා, (2) එම මුතුමැණිකා, (3) හේරත්මුදියන්සේලාගෙදර පිංචිඅම්මා | 0 | 0 | 6·1 |
| 24 | දේවාලේවත්ත | එම | (1) පහලගෙදර පුංචිබන්ඩා, (2) එම කිරල, පුවක්පිටියේ පදිංචි | 0 | 0 | 1 |
| 25 | පහලගෙදරවත්ත හෝ නොහොත් දේවාලේවත්ත | එම | (1) පහලගෙදර කිරිබන්ඩා, අත්තරගල්ලෑව ගම්ආරච්චි, (2) කොටවෙල පදිංචි පහලගෙදර පිකිරිබන්ඩා, (3) ඇලහැර පදිංචි පහලගෙදර පුංචිබන්ඩා | 0 | 1 | 35·5 |
| 26 | එම | එම | එම | 0 | 1 | 13·2 |
| 27 | කිරිමැටියේගෙදරවත්ත | එම | ඇලහැර පදිංචි (1) කිරිමැටියේගෙදර හිංගිරිබන්ඩා, (2) උක්කුබන්ඩා, කෝන්ගහවෙල හිටපු කෝරල, (3) එච්. ඇම්. බී. ඔපල්ගල, අඹන ගම්ආරච්චි, (4) ඔපල්ගල පදිංචි එච්. ඇම්. පුංචිබන්ඩා | 0 | 0 | 3 |
| 28 | එම | එම | එම | 0 | 0 | 13·6 |
| 29 | මොරගොල්ලේවත්ත | එම | ඇලහැර පදිංචි මොරගොල්ලේගෙදර හිංගිරිබන්ඩා | 0 | 0 | 15·8 |
| 30 | ඉඩන්ගෙදරවත්ත | එම | ඇලහැර පදිංචි (1) ඉඩන්ගෙදර කම්රල, (2) එම මුදියන්සේ, (3) එම හීන්බන්ඩා | 0 | 0 | 8·6 |
| 31 | අළුත්ගෙදරවත්ත | එම | ඇලහැර පදිංචි (1) අළුත්ගෙදර පුංචිබන්ඩා, (2) එම අප්පුහාමි | 0 | 0 | 18 |
| 32 | පියන්නවත්ත | එම | ඇලහැර පදිංචි මොරගොල්ලේගෙදර හිංගිරිබන්ඩා | 0 | 0 | 12·2 |
| 33 | වෙන්දේසිගෙදර වත්ත, පියන්නවත්තේහේන | එම | ඇලහැර පදිංචි (1) කිරිබත්කුඹුරේගෙදර පුංචිබන්ඩා, (2) එම උක්කුඅම්මා, (3) හෙලඹගහවත්තේ උක්කුබන්ඩා, (4) එම කළුබන්ඩා | 0 | 0 | 2 |
| 34 | එම | එම | ඇලහැර පදිංචි (1) වෙන්දේසිගෙදර කිරල, (2) පිළිහුඩුගොල්ලේ පදිංචි වෙන්දේසිගෙදර කිරිමැණිකා | 0 | 0 | 16·8 |
| 35 | වීරගහමුලවත්ත | එම | (1) ජී. ඇම්. පුංචිබන්ඩා, ඇලහැර ගම්ආරච්චි, (2) ඇම්. ඩබ්ලිව්. ආර්. බන්ඩා, කබරව කෝරල, (3) ඩබ්ලිව්. කළුබංඩා, (4) ඩබ්ලිව්. උක්කුබන්ඩා, හෙලඹගහවත්තේ ගම්ආරච්චි | 0 | 0 | 13·5 |
| 36 | පහලගෙදරවත්ත | එම | (1) ඇලහැර පදිංචි පහලගෙදර පුංචිබන්ඩා, (2) පුවක්පිටියේ පදිංචි එම කිරල | 0 | 0 | 9·5 |
| 37 | මහන්නලේගෙදරවත්ත | එම | (1) ඇලහැර පදිංචි මහන්නලාගෙදර හොරතලා, (2) එම කිරා, (3) කන්දේපිටවල පදිංචි එම සොබනා, (4) ඇලහැර පදිංචි එම කළු | 0 | 0 | 13·6 |
| 38 | අඹගහගෙදරවත්ත | එම | (1) හෙලඹගහවත්තේ පදිංචි ඉහලගෙදර පුංචිඅම්මා, (2) එම මුතුමැණිකා, (3) හේරත්මුදියන්සේලාගෙදර පුංචිඅම්මා | 0 | 0 | 13·8 |
| 39 | දේවාලේවත්ත | එම | (1) ඇලහැර පදිංචි පහලගෙදර පුංචිබන්ඩා, (2) පුවක්පිටියේ පදිංචි එම කිරල | 0 | 0 | 8·5 |
| 40 | — | අළුත් පාර | (1) ජේ. ජී. ඇම්. හිංගිරිබන්ඩා, ඇලහැර හිටපු ආරච්චි | 0 | 0 | 13 |
| 41 | — | එම | (1) ඇලහැර පදිංචි කේ. පුංචිරල, (2) කේ. කිරිබන්ඩා, (3) කේ. අප්පුහාමි, (4) කේ. උක්කුඅම්මා | 0 | 0 | 9·4 |
| 42 | — | එම | (1) ඇලහැර පදිංචි කේ. මුදියන්සේ, (2) කේ. උක්කුඅම්මා, (3) කේ. අප්පුහාමි, (4) කේ. කළුබන්ඩා, (5) කේ. හීන් උක්කුඅම්මා, (6) කේ. හීන් උක්කුබන්ඩා, (7) පී. උක්කුබන්ඩා, (8) පී. මලෑකු උක්කුබන්ඩා | 0 | 0 | 11·5 |
| 43 | — | එම | (1) ඇලහැර පදිංචි කේ. මුදියන්සේ, (2) කේ. අප්පුහාමි, (3) කේ. පුංචිබන්ඩා, (4) කේ. බන්ඩිරල, (5) කේ. කළුබන්ඩා | 0 | 0 | 16·4 |
| 44 | කිරිබත්කුඹුරේගෙදර වත්ත, තලයොබයා වත්ත | එම | එම | 0 | 1 | 21·5 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ සැප්තැම්බර් මස 19වෙනි දින පෙරවරු 9.30ටයේ කනිසමට ඇලහැර ඉජිනේරු කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 15වෙනි දින
මාතලේ කච්චේරියේදීය.

ආර්. එච්. බී. ඇන්ඩර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—පැල්මඩුල්ලේ-කල්ටොප් පාරේ හැතැප්ම 73ගේ කනුවේ වංගුව දිගුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර බලය අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ අංක. 200. ගම—උතුරු හුනුවල.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 479 | පෙලෙන්ගහවත්ත | වත්ත, කොසෙල් පඳුරු 4ක් තිබේ | සන්සිලෙබ්බේ මරික්කාර් අබ්දුල්ලා | 0 | 0 | 1·2 |
| 480 | එම | වත්ත, කොසෙල් පඳුරු 10ක් සහ උළුසෙවිලිකල කඩේකියක් කොටසක්ද | විජේතුන්ගපටබැඳිගේ පිලියම් සිල්වා සහ තවත් අය | 0 | 0 | 4·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අයට ලියමනක්දී වර්ෂ 1939ක්වූ සැප්තැම්බර් මස 11වෙනි දින උදේ 10ගේ කාලයට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑම සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 15වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇම්. රොබින්ස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට; ඒනම්:—පාවිටගම වෙල්මලට වතුරගැනීමට (කොන්ක්‍රීට් බඳමෙන්) අමුනක් හැදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමැති කාණ්ඩයේ කර තිබෙන පංතීන්තුවල ප්‍රකාරයෙන් උතුමාණන්වහන්සේගෙන් අදිකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

පිඹුරේ නො. A 244. ගම—ගල්අතර.

| නො. | ඉඩමේ නම. | අක්‍රම. | අයිතිකාරකියන්නෝ. | මනන, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | පිටවෙලඅස්වැද්දූම .. | කුඹුර .. | ගල්අතරේ පදිංචි ඒ. ජේ. සෙන්දියා .. .. | 0 | 0 | 2·3 |
| 2 | එරම්නිගමමනකුඹුර හෝහොත් අස්වැද්දූම | එම .. | ගල්අතරේ පදිංචි (1) ජේ. සෙන්දියා, (2) ජේ. සවනා, (3) ජේ. පිංචි උක්කුවා, (4) ජේ. බී. ගුණවර්ධන, (5) ජේ. මොහොතා, (6) ජේ. කරුණාදස, (7) ජේ. ගුණදර, (8) ජේ. සන්දර, (9) ජේ. කිරිමැණිකා සහ (10) ආර්. රන්කිරා, උඩුවෙල පදිංචි (11) ඒ. කිරිසඳ, සහ (12) ගරු | 0 | 0 | 1·6 |
| 3 | හැඩැඹිබේවත්ත හෝහොත් පහලවත්ත | ඔවිට .. | ගල්අතරේ පදිංචි (1) ජේ. සෙන්දියා, (2) ජේ. සවනා, (3) ජේ. ගුණදර, (4) ජේ. සන්දර, (5) ජේ. කිරිමැණිකා, (6) ජේ. බී. ගුණවර්ධන, (7) ජේ. මොහොතා, (8) ජේ. පිංචි උක්කුවා සහ (9) ජේ. කරුණාදස | 0 | 0 | 0·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහත කී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1939ක්වූ සැප්තැම්බර් මස 28වෙනි දින උදේ 9.30ගේ කාලයට උස්සාපිටියේ පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑම සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1939ක්වූ අගෝස්තු මස 10වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ආර්. අබේසිංහ,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.